# හංස අස්ප කොක් බූරු සංකල්පය නොහොත් නිර්පාක්ෂිකයා



සාමන්ත තැන්නගේ

මෙ වර ජනාධිපතිවරණයට අශ්වයන් දෙදෙනෙකු හා බූරුවන් විසි දෙනෙකු තරඟ කරන (කෙරූ) බව එස්. එල් ගුණසේකර විසින් සඳහන් කර තිබූ බව පසුගියදා දිවයින පුවත් පතක පළවූ ලිපියක සඳහන්ව තිබුණි. මේ කියමනේ කිසියම් අර්ධ සත්‍යයක් ඇති බැව් ජනාධිපතිවරණය පැවති 26 වෙනිදා බොහෝ දෙනෙකුට වැටහිණි. එදින ඡන්ද පොළට ගිය හැරමිටියෙන් යන මහලු කාන්තාවෝ පවා මැතිවරණ කොමසාරිස් පුන පුනා කියූ පරිදි තම අනන්‍යතාව තහවුරු වන හැඳුනුම්පතක් රැගෙන යාමට අමතක නොකළෝය. එහෙත් එක්තරා ජනාධිපති අපෙක්ෂකයෙන් අත්දෙක වන වනා ගොස් අවසානයේ මැතිවරණ කොමසාරිස්ට පිංසිදුවන්නට තමාගේ ඡන්දය දමා ගත්තේය. මෙබඳු අපේක්ෂකයන් දහ පහළොස් දෙනෙකු ඉදිරිපත් වී නම් මැතිවරණ කොමසාරිස්ට දෙවියන්ගේම පිහිට ලැබෙනු ඇත. තවත් අපේක්ෂකයෙකුට තමාගේ ඡන්දයද නොතිබුණි.

පෙනෙන්නට සිටි අශ්වයන් දෙදෙනාගෙන් එකෙකු සැබැවින්ම බොහෝ පාර්ශවයන් විසින් මවා පෙන්වන ලද අශ්වයෙක් බව ප්‍රතිපල නිකුත් වීමත් සමඟම කාට කාටත් වැටහී යන්නට විය. ඌ ඉතා වේගයෙන් දුවන බව බැලූ බැල්මට පෙනෙන්නට විය. එහෙත් උගේ පාද හතර ගමන් කළේ හතර පැත්තකටය. එක් පාදයක් හමුදාව දෙසටත්, අනෙක් පාදය ජාත්‍යන්තරය දෙසටත්, තවත් පාදයක් කාල් මාක්ස් පැත්තටත් අවසාන පාදය ඊලම දෙසටත් එල්ල වී තිබිණි. මේ අපභ්‍රංශ අශ්වයා වනාහි බොහෝ විට මංගලට දාව උපදින්නට ඇතැයි සිතිය හැකි පොදු අපේක්ෂකයාය. ජනතා විමුක්ති පෙරමුණ විසින් පොදු අපේක්ෂකයා නිර්පාක්ෂික ලෙසින් බෞතිස්ම කර උගේ අවජාතක පියා වනවාත් සමඟ 71 කැරැල්ලෙන් නන්නත්තාරව ජාත්‍යන්තරයට වී සිටි ඊනියා මානව හිතවාදීහුද ලහි ලහියේ ජාත්‍යන්තර කෑමද රැගෙන අපභ්‍රංස අශ්වයා අස්වැස්සීමට ගියෝය.

නිර්පාක්ෂික අපේක්ෂකයා යනු නපුංසක සංකල්පයකි. එය කිසිදාක සිදුවිය නොහැක්කකි. මහින්ද පන්නා දැමීම පොදු අපේක්ෂකයා නම් වූ සත්ත්වයා නිර්මාණය කළ අයගේ දැවෙන අවශ්‍යතාවය විය. කලක් ගැළවීමේ හමුදාවටත් නොගැලපුනු හිටපු හමුදාපති රටේ ජනාධිපති කමට සුදුසු වූයේ කෙසේදැයි මොළේ කළඳක් හෝ තිබුණානම් ඕනෑම මෝඩයෙකුට පවා වැටහෙන කාරණයකි. එදා තවලමේ ගිය මංගලට කිසිදාක ලංකාවේ ජනතාව ගැන වැටහෙනු ඇතැයි සිතිය නොහැකිය. මෙවර ඔහු බහුතර සිංහල ජනතාව සදාකාලිකවම යුද්ධයට ආශිර්වාද කරනු ඇතැයි සිතා මහින්දට එරෙහිව භාවිතා කළ හැකි හොඳම තරුම්පුව ලෙස සරත්ව තෝරා ගන්නට ඇත. එහෙත් ඉතිහාසය පුරා ජීවත් වූ සැබෑ ශ්‍රී ලාංකිකයා වූ කලී කඩුවක් අවැසි කල කඩුවක් ගත්, එහෙත් එහි කාර්‍යය නිමැවූ පසු උතුරු සළුව කරට ගත් ජාතියක් බව තේරුම් ගැනීමට ඔහුට නොහැකි විය. ඔහුගේ කල්පනාව වන්නට ඇත්තේ එක් අතකින් ජාතිවාදී සිංහල ඡන්දත්, අනෙක් අතින් ජාතිවාදී දෙමළ ඡන්දත්, තවත් අතකින් කැපුවත් නොවෙනස් වන කොළ ඡන්ද සහ කාල් මාක්ස්වාදී ඡන්දත් එකට එකතු කර මහින්ද පන්නා දැමීම විය යුතුය.

අනෙක් අතින් ජනාධිපතිවරණයකට ඉදිරිපත් වීම යනු මෙතෙක් කලක් රනිල් දිවි හිමියෙන් රැක ගත් විපක්ෂ නායකකමද තමන්ගෙන් අහිමි වීමට හේතුවක් විය හැකිව තිබූ බැවින් සරත් වූ කලී රනිල්ගේ නියං කලට වට හිරිපොද වැස්සකි.

කරුණු එසේ වුවද පොදු අපේක්ෂකයා නිර්පාක්ෂිකයා බවට පත් කළ ජනතා විමුක්ති පෙරමුණේ භූමිකාව මෙහිදී බොහෝ ගැඹුරෙන් විමසා බැලීමට වටී. ජනතා විමුක්ති පෙරමුණට එකල ප්‍රේමදාස ජනාධිපතිගෙන් අවශ්‍ය වූයේ ඉන්දියන් සාම සාධක හමුදාව පන්නා දැමීම පමණය. ප්‍රේමදාසගේ ප්‍රධාන ඡන්ද පොරොන්දුව වූයේද සාම සාධක හමුදාව ඉවත් කිරීමයි. මෙම පොරොන්දුව ඉටුවන මානයට එන විටම ජවිපය තමන්ගේ නීති විරෝධි වර්ජන රැල්ල තවදුරටත් ක්‍රියාත්මක කර පොදු බස්රථ, ට්‍රාන්ස්පෝමර ආදිය ගිනි තබා නැති ප්‍රශ්නයක් අර්බුදයක් කිරීමට ගොස් රටට අහිමි කළ ජීවිත ගණන කොතෙක්ද කියා කිසිවෙකුටත් කිව හැකිද? එදා, අද කොටින්ට ආවඩන එකඳු මානව හිමිකම් සංවිධානයක්වත් ජනතා විමුක්ති පෙරමුණ දෙස හැරී නොබලද්දී අතුරුදහන් වූ තරුණයන් වෙනුවෙන් කරුණු දැක්වීමට ගියේ මහින්දය. ප්‍රේමදාසගෙන් ජවිපෙයට අවශ්‍ය වූ කර්තව්‍ය නිමවූ පසු ඔවුන්ට තව දුරටත් ප්‍රේමදාස අවශ්‍ය නොවීය. එබැවින් ඔහුට විරුද්ධව අවි හරඹ පෙන්වීමට ගොස් අවියෙන්ම නැසුණේ ලක්ෂ ගණනක් වටිනා ජීවිතද දැයට අහිමි කරමිනි. නායකයෝ හැකි අයුරින් විදෙස් රට වලට රිංගා ගත්හ. සමහරු රත්තරං ගොඩගසාගෙන බෝට්ටු වලින් තමන් පහර ගැසූ ඉන්දියාවටම පළාගිය බවද සඳහන්ය. ගම්වල ජීවත් වූ අහිංසක තරුණයෝ තම ජීවිත වලින් වන්දි ගෙවූහ. එදා ඒ තරුණ ජීවිත වලට වග කිවූ පාලකයෝ සමඟ අද ජවිපේ නායකයෝ එකට පෑහී තරු හතේ හෝටල් කාමර වල රැය පහන් කරන්නේ කෙසේද? ජවිපයේ එදා සිටි නායකයෝ අහිංසක තරුණ මළමිනී ලෝකයාට ප්‍රදර්ශනය කරමින් ජීවත් වූ ආකාරය අප සැවොම දනී. අද සිටින නායකයෝ කරන්නේද එයමය.

ජවිපයට 94 දී චන්ද්‍රිකා අවශ්‍ය වූයේ කරුණු දෙකකටය. ඉන් පළමු වැන්න තම අපෙක්ෂයාගේ ඡන්ද ප්‍රමාණය රහසක්ව තබා ගැනීමටය. දෙවැන්න ජනාධිපති පදවිය අහෝසි කර ගැනීමටය. ඔවුන්ට මහින්ද අවශ්‍ය වූයේ කොටින් විනාස කර දැමීමටය. කොටින් විනාස වූ පසුව ජවිපයට මහින්දව තබා ගැනීමට අවශ්‍ය නැත. එජාපය මෙන් නොව මහින්ද ජවිපයේ වල කැපීමට උත්සාහ කරන වගක් නොපෙනෙයි. එහෙත් තමන්ගේ වල කපා ගැනීමට ජවිපයට උදව් කරයි. එදා ඉන්දියන් හමුදාව පලවා හැර ප්‍රේමදාස ඉටු කළේ ජවිපයේ අරමුණයි. එහෙත් මෙදා මහින්ද කොටින් වැනසුවේ ජවිපයේ උවමනාකම් ඉටුකිරීමට නොව එය මහින්දගේ න්‍යාය පත්‍රයේ ඉහලින්ම තිබූ අංගයක් නිසාය. ඔහු ඒ සඳහා සුදුසු කාලය එළැඹෙන තුරු සිටියේය. ජවිපය අදටත් සිතන්නේත්, කියන්නේත් එය ඔවුන්ගේ තදියම නිසා කළ දෙයක් හැටියටය. මෝඩ කමට දිය යුත්තේ කවර බෙහෙතද?

එදා ප්‍රේමදාසට විරුද්ධව කැරළි උත්සන් කළේ කිසියම් අවස්ථාවකදීද, මෙදා මහින්ද අයවැයෙන් පරාජය කිරීමට ජවිපය උත්සාහ කළේද එබඳුම අවස්ථාවකදීය. එතැනින් පටන් ගත් ජවිපයේ මහින්ද පැන්නීමේ මෙහෙයුම සරත් පොන්සේකා එක්කරගැනීම දක්වාම දිව ගියේය. වරුවක් කල්පනා කළද රටට කළ වැඩක් මතකයට නගා ගත නොහැකි, එහෙත් මොහොතක් කල්පනා කර විකුණා දැමූ ආයතන දුසිමක් පමණ මතකයට නගා ගත හැකි චන්ද්‍රිකාව පැන්නීමට ජවිපයට නොතිබුණු තදියමක් මහින්ද පැන්නීමට ඇත්තේ ඇයිදැයි හැමදෙනාම කල්පනා කළ යුතුය. එසේම අවබෝධ කරගත යුතුය.

මේ ප්‍රශ්නයට පිළිතුරක් දීමට පෙරාතුව ජාතික නායකත්වයට එරෙහිව කොටින්ගේ ක්‍රියාකාරිත්වය යළි මතකයට නගා ගත යුතුය. ජාතික නායකත්වයට පත්වෙතැයි කොටි විශ්වාස කළ සෑම නායකයෙකුගේම ජීවිත බිළි ගැනීමට ඔවුහු ක්‍රියා කළහ. එහෙත් කොන්ද පණ නැති නරපනුවන්ට නියපිටින් හීරීමක්වත් නොකළේ ඔවුන් නායකත්වයට පමුණුවා දොන් ජුවන්ලාට අන්දවා තම සිතැඟි ඉටුකර ගැනීමටය. මහින්දත්, ගෝඨාත් කොටින්ගෙන් බේරුණේ ඔවුහු අවස්ථානුකූලව කටයුතු කළ නිසාය. අවස්ථාව ලැබෙන තුරු කට පරිස්සම් කරගත් නිසාය. දැන් තමන්ටම කියා ජාතික නායකත්වයක් ගොඩ නගා ගත නොහැකි ජවිපයේ ක්‍රියාකාරකම් කොටි ක්‍රියාකාරකම් හා සසඳා බලන්න. ජවිපයේ පරම ප්‍රජාතන්ත්‍රවාදී වාග් ප්‍රලාප තුළ සැඟව ඇත්තේද කොටින්ගේ අරමුණම නොවේද? ප්‍රේමදාසට ලැබුණේ දෙකොණ විළක්කුවක් නම් මහින්දට ලැබුණේ සිව් කොන් විළක්කුවකි. විළක්කුවෙහි වූ දරුණුම ගින්න මැඬලීමට ඔහු එකවර සටන් පෙරමුණු රැසක්ම කලමණාකරණය කරමින් සිටි අන්දම ගාල කඩා ගත් හරකුන් මෙන් හැසිරෙන රතු නායකයන්ට නොපෙනුනුනාට අහිංසක ගැමියාට පෙනුනේය. පරිනත නායකයෝ එක් ප්‍රශ්නයක් විසඳීමට ගොස් තවත් ප්‍රශ්නයක් හිසෙහි ලා නොගන්නෝය.

ජවිපයට පමණක් නොව අපටද මහින්දගේ කැබිනට් එක ලොකු වැඩිය. කැබිනට්ටුව කඩාගෙන ආණ්ඩුව කඩා ගන්නවාද නැද්ද යන තීරණය මහින්ද ගත යුතුව තිබුණි. පාර්ලිමේන්තුවම කැබිනට් එකට හරවා හෝ ජයගත යුතු තිබූ ජාතික ප්‍රශ්නය ජයගත් කල්හි ජවිපෙයට එය අබැටක තරම්වත් අගයක් නොගත් හැටි ? ජවිපෙයද සිතන්නේ යුද්ධය ජයගත්තේ හුදෙක් සරත් නිසා බවය. නැතිනම් ඔවුහු ජනතාව සිතා මතාම

ඌ ඉතා වේගයෙන් දුවන බව බැලූ බැල්මට පෙනෙන්නට විය. එහෙත් උගේ පාද හතර ගමන් කළේ හතර පැත්තකටය. එක් පාදයක් හමුදාව දෙසටත්, අනෙක් පාදය ජාත්‍යන්තරය දෙසටත්, තවත් පාදයක් කාල් මාක්ස් පැත්තටත් අවසාන පාදය ඊලම දෙසටත් එල්ල වී තිබිණි. මේ අපභ්‍රංශ අශ්වයා වනාහි බොහෝ විට මංගලට දාව උපදින්නට ඇතැයි සිතිය හැකි පොදු අපේක්ෂකයාය. ජනතා විමුක්ති පෙරමුණ විසින් පොදු අපේක්ෂකයා නිර්පාක්ෂික ලෙසින් බෞතිස්ම කර උගේ අවජාතක පියා වනවාත් සමඟ 71 කැරැල්ලෙන් නන්නත්තාර වී ජාත්‍යන්තරයට වී සිටි ඊනියා මානව හිතවාදීහුද ලහි ලහියේ ජාත්‍යන්තර කෑමද රැගෙන අපභ්‍රංස අශ්වයා අස්වැස්සීමට ගියෝය.

ඇන්දවීමට තැත් කරන්නේ මහින්ද රාජපක්ෂ නම් වූ චරිතය ඉතිහාසයෙන් මකා දැමීමට විය හැකිය. මහින්ද නම් චරිතයට ජනහදවත් තුළ මුල් ඇදීමට ඉඩ නොදීම ජවිපයේ සැබෑ අරමුණය. ජවිපයේ හැසිරීම තුළ අප දුටුවේ මහින්දාපදානය පොරොවෙන් කෑපීමට පෙර නියපොත්තෙන් කඩා දැමීමට ගන්නා තැතකි.

ජවිපය බෙදුම් වාදයට විරුද්ධය. එහෙත් බෙදුම්වාදය තවමත් කරතබාගෙන සිටින ද්‍රවිඩ ජාතික සංධානය හා නිර්පාක්ෂික අපේක්ෂකයා එක්වීමට පක්සය. ද්‍රවිඩ ජාතික සංධානය මහින්දට යෝජනා මාලාවක් ගෙනාවේය. මහින්ද එකඟ නොවීය. එහෙත් ජවිපයට අනුව ද්‍රවිඩ ජාතික සංධානය සරත්ට සහයෝගය දෙන්නේ කිසිඳු ඉල්ලීමක් නැතිවය. මෙය සිදුවිය හැකි දෙයක් නොවන බව ජවිපෙයද සැබවින්ම නොදන්නවා නොවේ. එහෙත් තම අරමුණ වෙනුවෙන් ගල් ගිලිති. මේ සිදුවීම් දෙක සැසඳූ කළ ජනතාවට ජවිපය තකහනියේ කරන නූල් සූත්තර දැක ගැනීමට පුළුවන.

සැබවින්ම නිර්පාක්සිකයා වනාහි අරුම පුදුම අභූත සත්ත්වයෙකි. ඔහුගේ අභූතස්වභාවය තරමක් හෝ වටහා ගෙන සිටියේ රනිල් පමණි. යම් හෙයකින් නිර්පාක්ෂික අපේක්ෂකයා ජයගත්තේ නම් රනිල් තමන් විධායක අගමැති වෙතැයි මුලින් සිතා සිටින්නට ඇත. පසුව ජවිපය විසින් සොයා ගත් නිර්පාක්සික අගමැතිට රනිල් කමැති වූ වගක් නොපෙනිණ. නිර්පාක්සිකයාට සියලුම පාර්ශවයන් උදව් කළේ පටු අරමුණු මුදුන් පත් කරගැනීමට බව සුපැහැදිළි සත්‍යයකි.

1989 දී පොදු දේපළ තමන්ගේ අම්මා අප්පගෙන් ලැබුණු දෙයක් සේ සලකා ඒවා වනසා බලය ඇල්ලීමට මාන බැලූ ජවිපය පැවසුවේ ප්‍රශ්න වලට විසඳුම් ඇතත් අර්බුදයන්ට

9 වන පිටුවට